බුලත්සිංහල ප්‍රාදේශීය සභාව - 2023

---------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

බුලත්සිංහල ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය , ශුද්ධ වත්කම්/ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය ,මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට බුලත්සිංහල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ

අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරුකිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන් ,ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ වියදම රු.2,103,503 වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු.5,420,731 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 4,502,502 | 3,399,060 | 3,905,678 | 1,658,843 | 4,247,502 | 3,332,380 | 4,311,869 | 1,984,073 |
| (ii) | කුලී | 5,431,000 | 2,702,889 | 5,021,657 | 129,404 | 5,281,000 | 2,975,519 | 5,161,784 | 236,173 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,005,500 | 572,843 | 888,338 | 37,500 | 880,500 | 410,166 | 600,775 | 72,041 |
| (iv) | වෙනත් ආදායම් | 11,056,500 | - | 9,560,738 | - | 88,011,416 | - | 96,958,113 | - |
| | | 21,995,502 | 6,674,792 | 19,376,411 | 1,825,747 | 98,420,418 | 6,718,065 | 107,032,541 | 2,292,287 |

2.2.2 **ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **(අ) වරිපනම් හා බදු** | | |
| (i) සමාලෝචිත වර්ෂය ආරම්භයට වරිපනම් බදු හිඟය රු.1, 790,198 ක් වූ අතර වර්ෂය තුලදී ඉන් රු.860,274 ක් හෙවත් සියයට 48 ක් අයකර නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) සමාලෝචිත වර්ෂයේ වරිපනම් බදු බිල් කිරීම රු.2,090,106 ක් වූ අතර වර්ෂය අවසානයේ රු.582,209 ක් හෙවත් සියයට 28 ක් අයකර ගෙන නොතිබුණි. | -එම- | ප්‍රවර්තන ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (iii) සමාලෝචිත වර්ෂය ආරම්භයට අක්කර බදු හිඟය රු.61,912 ක් වූ අතර වර්ෂය තුලදී ඉන් රු.48,509 ක් හෙවත් සියයට 78 ක් අයකර නොතිබුණි. | මේ වන විට අයකර නොමැති ශේෂය රු.39,192 ක් වන අතර එය කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| **(ආ) වෙනත් ආදායම්** | | |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු.7,000,000 ක් හා මුද්දර ගාස්තු රු.13,441,015ක් විය. | ආදායම් අයකර ගැනීමට කටයුතු කරන බව. | ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යනාදිය සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 93 වගන්තිය ප්‍රකාරව සියළු වැසිකිළි හා වැසිකිළි වලවල් නිසි කාල සීමාව තුලදී විධිමත් ලෙස පවිත්‍ර කිරීම් හා හිස් කිරීම් සඳහා අවශ්‍ය සියළු පියවර ගැනීම ප්‍රාදේශීය | අදාල මහජන ඉල්ලීම් අගලවත්ත හෝ හොරණ ප්‍රාදේශීය සභාවන්ට යොමු කිරීම සිදු කරන බව. | බල ප්‍රදේශය තුල මළ අපද්‍රව්‍ය නිසි පරිදි බැහැරලීම සඳහා අවශ්‍ය පහසුකම් සලසා ගත යුතුය. |

සභාවේ කාර්යය විය යුතුය. එහෙත් බල ප්‍රදේශය තුල මළ අපද්‍රව්‍ය බැහැර කිරිම සඳහා වර්ෂ 2½ ක කාලයක සිට ගලිරථ සේවාවක් පවත්වාගෙන ගොස් නොතිබුණි.

### 3.2 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගුරුගේ දේපල වෙළඳාම් සමාගම විසින් 1992 මැයි 15 දින කැබලි කරන ලද අංක 278 දරන පිඹුර මගින් පොදු කටයුතු සඳහා ඉඩම් කොටසක් ප්‍රාදේශීය සභාවට වෙන් කර නොතිබියදී ප්‍රාදේශීය සභාවේ උපසභාපතිවරයෙකු විසින් කිසිඳු අනුමත කිරීමේ බලයකින් තොරව එම පිඹුර අනුමත කර තිබුණි. බුලත්සිංහල ප්‍රාදේශීය සභාවට පොදු ක්‍රීඩාංගනයක් සෑදීමට මෙම ඉඩමෙන් කොටසක් ලබා ගැනීමට 1996 වර්ෂයේ සිට සභාව සැලසුම් කළද අදාල ඉඩම් කොටස 2001 වර්ෂය වන තුරුත් සභාවට පවරා ගැනීමට කටයුතු නොකිරීම මත ගුරුගේ දේපල වෙළඳාම් සමාගම විසින් සභාවට විරුද්ධව නඩු පවරා තිබූ අතර එහි තීන්දුව ප්‍රකාරව 2022 දෙසැම්බර් මස වන විට එකතුව රු.7,839,997 ක් සභාව විසින් ගුරුගේ දේපල වෙළඳාම් සමාගමට වන්දි ලෙස ගෙවා තිබුණි. කෙසේ වුවද, උපසභාපතිවරයා විසින් සිදු කරන ලද නීත්‍යානුකූල නොවන ක්‍රියාව සම්බන්ධයෙන් ඔහුට එරෙහිව කිසිඳු ක්‍රියා මාර්ගයක් සභාව විසින් ගෙන නොතිබූ අතර මුදල් රෙගුලාසි 108 හා 156 ප්‍රකාරව සභාවට සිදු වූ මූල්‍ය අලාභය සඳහා වගකිව යුතු පාර්ශව හඳුනාගෙන එම මුදල් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් කටයුතු කර නොතිබුණි. | විමර්ශන කටයුතු ආරම්භ කර ඇති බව. | යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පාඨකයින් විසින් බැහැර ගෙන යන පුස්තකාල පොත් දින 14 කින් ආපසු භාරදිය යුතු වුවද, සභාව සතු පුස්තකාල 05 යටතේ වර්ෂ 20 කට වඩා වැඩි කාලයක සිට බැහැරදුන් රු.140,290 ක් වටිනා පුස්තකාල පොත් 644 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් භාරදී නොතිබියදී එම පොත් ආපසු ලබා ගැනීමට හෝ අදාල පාර්ශවයන්ගෙන් වටිනාකම අයකර ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි. | වටිනාකම අයකර ගැනීමට කටයුතු කරන බව. | බැහැර දෙන පුස්තකාල පොත් නැවත ලබා ගැනීමට හෝ අදාල පාර්ශවයන්ගෙන් වටිනාකම අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

3.4 **වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් වාහන 03 ක අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | වාහන අයිතිය ආයතනයේ නමට පවරාගෙන නැති බව. | වාහනවල අයිතිය ආයතනය නමට පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 127 වගන්තිය හා 1946 අංක 57 දරන පොදු සුසාන හා පෞද්ගලික සුසානභූමි පිළිබඳ ආඥා පනතේ 03 වගන්තිය ප්‍රකාරව නිසි බලධාරියා වන ප්‍රාදේශීය සභාව විසින් සභා බල ප්‍රදේශය තුල පවතින සුසානභූමි 33 ක් සභාව වෙත පවරාගෙන නොතිබුණි. | සුසානභූමි 12 ක් සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ සහ මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශ ලද පසු පවරා ගැනීමේ කටයුතු සිදු කරන බව . | යොමුගත පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

3.5 **කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපනය ව්‍යාපෘතියේ (1Project) පළමු අදියර යටතේ සභා බල ප්‍රදේශයේ මාර්ග 05 ක් සම්පූර්ණයෙන්ද , මාර්ග 05 ක් අර්ධ වශයෙන්ද සංවර්ධනය කර තිබුණි. අන්තර් සම්බන්ධිත කුට්ටි ගල් ඇතිරූ කොටස් සංවර්ධනයේදී ඉවත් කරන ලද කුට්ටි ගල් සභාවට නැවත භාර දිය යුතු වුවද, ඇතැම් සම්බන්ධිත කුට්ටි ගල් කොටස් සභාවට භාරදීමකින් තොරව පෞද්ගලික ඉඩම්වල තැන්පත් කර තිබුණි. | මාර්ග 05 ක කුට්ටිගල් අතුරා සංවර්ධනයටත් ඉතිරි ගල් සභාව වෙත රැගෙන ඒමටත් කටයුතු කරන බව. | සභාව වෙත භාර නොදුන් කුට්ටි ගල් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

3.6 **මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2001 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුල නිලධාරින් 04 දෙනෙකුගෙන් සභාවට අයවිය යුතු රු.262,840ක ණය ශේෂයක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඇපකරුවන් දැනුවත් කිරීම, ණය අයකර ගැනීම, සමථ මූල මණ්ඩලයට යොමු කිරීම හා වැන්දඹු අනත්දරු මුදලින් අය කිරීමට කටයුතු යොදා ඇති බව. | ණය ශේෂ අයකර ගත යුතුය. |